# 2025/2026 වර්ෂය සඳහා ඉඩම් මහ ලේකම් කාර්යාලයට සහ ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවට අයත් කාර්යාලවලට සහ ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ මොරටුව කාර්යාල පවිත්‍රතා සේවා සැපයීම සඳහා මිල ගණන් කැඳවීම.

බත්තරමුල්ල, රජමල්වත්ත පාර, අංක 1200/6, 'මිහිකත මැදුර', ඉඩම් මහ ලේකම් කාර්යාලයේ පහත දැක්වෙන කාර්යාලයන්ට 2025/2026 වර්ෂය වෙනුවෙන් පවිත්‍රතා සේවා සැපයීම සඳහා සුදුසුකම් ලත් පවිත්‍රතා සේවා ආයතනයන්ගෙන් මිල ගණන් කැඳවනු ලැබේ. මෙම කාර්යාල සියල්ල සඳහාම මිල ගණන් ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ.

(අ) ඉඩම් මහ ලේකම් කාර්යාලය, 'මිහිකත මැදුර', අංක 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

(ආ) රජයේ ඉඩම් තොරතුරු කළමනාකරණ මධ්‍යස්ථානය,ලෝක ආහාර ගබඩාව හා කාර්යාලය සහ ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ මොරටුව කාර්යාල, බොරුපන පාර, රත්මලාන.

(ඇ) ඉඩම් කොමසාරිස් කාර්යාලය, දෙබරවැව, තිස්සමහාරාමය.

(ඈ) ඉඩම් කොමසාරිස් කාර්යාලය, තානායම පාර, මහියංගණය.

(ඉ) සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාලය, කන්තලේ.

02. මේ සඳහා උනන්දුවක් දක්වන යෝග්‍ය ලංසුකරුවන් සඳහා 2025 ජනවාරි 31 දින සිට 2025 පෙබරවාරි 24 දින දක්වා කාර්යාලීය දිනයන්හිදී පෙ.ව 9.00 සිට ප.ව 3.00 දක්වා කාලය තුල එක් ප්‍රසම්පාදන ලිපි ලේඛන කට්ටලයක් සඳහා රු.3,500.00 ක ආපසු නොගෙවන ගාස්තුවක් ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ සරප් වෙත ගෙවීමෙන් ලංසු ලියවිලි ලබා ගත හැකිය. මෙම ගෙවීම මුදලින් පමණක් සිදු කළ යුතුය. ලංසු ලියවිලි පහත ලිපිනයේදී කිසිදු ගෙවීමකින් තොරව පරීක්ෂා කළ හැකිය.

03. ලංසු ඉදිරිපත් කිරීමේදී රු.112,300.00 ක සුරක්ෂණ ඇපකරයක් සෑම ලංසුවක් සමඟ ඉදිරිපත් කළ යුතුය.(එය මහ බැංකුවේ පිළිගත් වාණිජ බැංකුවකින් ලබාගත් ආරක්ෂණයක් ඉදිරිපත් කිරීමෙන් කළ හැක.) 2025.02.25 දින සිට දින 60ක් සඳහා වලංගු වන සේ ඉදිරිපත් කළ යුතුය.

04. මුද්‍රා තබන ලද ලංසු ලියාපදිංචි තැපෑලෙන් සභාපති, ප්‍රසම්පාදන කමිටුව, ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව, ඉඩම් මහ ලේකම් කාර්යාලය, 'මිහිකත මැදුර', අංක 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල යන ලිපිනයට එවීමට හෝ දෙපාර්තමේන්තුවේ ගිණුම් ශාඛාවේ ඇති ලංසු පෙට්ටියට බහාලීමට හැක. ලංසුපත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "පවිත්‍රතා සේවා සැපයීම සඳහා ලංසුව 2025/2026' යනුවෙන් සඳහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. ලංසුපත් භාර ගැනීම 2025.02.25 දින ප.ව. 2.00 ට අවසන් වන අතර එම වේලාව ඉකුත් වූ වහාම ලංසු විවෘත කරනු ලැබේ. ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ට එම අවස්ථාවට සහභාගී විය හැක.

05. වැඩි විස්තර අවශ්‍ය වේ නම් ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ පහත අංක මගින් විමසීමෙන් ලබා ගත හැක.

ප්‍රධාන ගණකාධිකාරී - දුරකථන අංකය 011-2875833

ගණකාධිකාරී (සැපයීම්) - දුරකථන අංකය 011-2797434

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව,
'මිහිකත මැදුර', අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.
2025.01.